සන්නස

**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
sjturaus@optusnet.com.au

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

**වැදගත්**

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දක්වීමට අවසර ඇත



# සයිටම් ප්‍රශ්නය
# සයිටම් ආයතනයට එහා ගිය ප්‍රශ්නයකි

**රංග ජයසූරිය**

ප්‍රශ්නයට අදාළ සියලු පාර්ශ්ව සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව මාලබේ සයිටම් අධ්‍යාපනික ආයතනය පිළිබඳ තීරණයක් ගන්නා බව මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා කියයි. සමහර විට, කළ යුතුව ඇති නිවැරදි දෙය වන්නේ, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් වෙනස් තීන්දුවක් නොදෙන්නේ නම්, දැනට අධිකරණයෙන් දී තිබෙන විනිශ්චය ක්‍රියාත්මක කිරීමයි. විවේචකයන් සුළු පිරිසකගේ ඝෝෂාවක් සමනය කිරීම සඳහා නීතිය වෙනස් කිරීම හෝ නීතියක් ක්‍රියාත්මක නොකර සිටීම, මේ රටේ බොහෝ කලක් තිස්සේ කරගෙන යන පුරුද්දකි. එය නීතියේ ආධිපත්‍යයේ සමස්ත කඩා වැටීමට හානිකර ලෙස බලපා තිබේ.

සයිටම් පිළිබඳ ප්‍රශ්නය, අනාගතයේදී වෛද්‍ය උපාධිධාරීන් වීමට සිටින අතලොස්සකගේ ඉරණමක් පිළිබඳ ප්‍රශ්නයක් විණි නම්, ප්‍රශ්නය ඉතා සරළ ය. ප්‍රශ්නය එය නම්, උපයෝගීතාවාදී දෘෂ්ටි කෝණයකින් (කිහිප දෙනෙකුට අවැඩක් වෙතත්, වැඩි දෙනාගේ වැඩි යහපත සඳහා යමක් කිරීම යුක්ති සහගත කෙරෙන දෘෂ්ටි කෝණයෙන්) බලන කල, ශිෂ්‍ය විරෝධතා පෙළපාලි, වෛද්‍ය වැඩ වර්ජන ආදී මහා ගාලගෝට්ටි ඇති කර ගැනීමේ ප්‍රයෝජනයක් නැත. ඒ කන්දොස්කිරියාව වෙනුවෙන් විරෝධතාකරුවන්ගේ හට සවන්දීම වඩාත් උචිත ය. ප්‍රශ්නය එසේ විසඳා ගැනීම තවත් එවැනි ප්‍රශ්න මාලාවකට තල්ලුවක් විය හැකි බවට අතීතයේ ඇති අත්දැකීම් වෙනම කාරණයකි.

එහෙත් සයිටම් ප්‍රශ්නය යනු, හුදෙක් සයිටම් ආයතනය පිළිබඳ ප්‍රශ්නයක්ම නොවේ. එය, මේ රටට නැතිවම බැරි පෞද්ගලික අධ්‍යාපනයේ අනාගතය පිළිබඳ ප්‍රශ්නයකි. අනිත් පැත්තෙන් ගත් විට, එය මහජන මුදලින් නඩත්තු කෙරෙන, තරගයක් නැති කම නිසා දීර්ඝ කාලයක් තිස්සේ කඩා වැටෙමින් ඇති, පොදු අධ්‍යාපනයේ අනාගතය පිළිබඳ ප්‍රශ්නයක් ද වන්නේය. ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්ව විද්‍යාල, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ

**උසස් අධ්‍යාපනයේ ඒකාධිකාරී අයිතිය ආණ්ඩුව සතු විය යුතු යැයි කියන කෙනෙකු අද නැති තරම් ය. උසස් අධ්‍යාපනය පමණක් නොව, වෙන කිසි දෙයක් සම්බන්ධයෙන් වුව ආණ්ඩුවක් ඒකාධිකාරී බලයක් අභ්‍යාස කිරීම වනාහී, තමන්ට බැරි බරක් බදා ගැනීමකි.**

දිනෙන් දින වැඩෙන ජගත් තරගකාරීත්වයට මුහුණදිය නොහැකි තත්වයකට පත්ව ඇති අතර, අඩ සියවසකට ඉහතින් ක්‍රියාවට දැමූ සහ එදා මෙදා තුර වෙනස් නොවූ, යල්පැනගිය පටු ආයතනික ව්‍යුහයක් තුළ ක්‍රියාත්මක වීම හේතුවෙන්, ලෝකයේ

8 වන පිටට

මෙම ස්ථානයේ වෙළඳ දැන්වීම් සඳහා විමසන්න - අසෝක 0432 391 922

